www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රවීන්ද්‍රනාතන් සෙන්දිල් රවි සහෝදරයා වෙනුවෙන් පැරිස් නුවර අනුස්මරන රැස්වීමක්

## Memorial meeting planned in Paris for Comrade Raveenthiranathan Senthil Ravee

**2007 මාර්තු 29**

රවින්ද්‍රනාතන් සෙන්දිල් රවිට ගෞරවය පුද කරනු පිනිස අප්‍රේල් 15 වන ඉරිදා පැරිසියේ දී අනුස්මරන රැස්වීමක් පැවැත්වීමට හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය සූදානම් වේ.

ලන්ඩනය බලා දිවෙන මහා මාර්ගයක දී පෙබරවාරි 28 දා අලුයම සිදු වූ මෝටර් රථ අනතුරකින් මිය ගිය සෙන්දිල් සහෝදරයා ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය වන හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ දෙමල ජාතික සාමාජිකයෙකි. ඔහු සිය සොහොයුරියගේ සරනාගත අයිතිය සහතික කර ගැනීමේ ප්‍රයත්නයක යෙදෙනු පිනිස පැරිසියට ගොස් පෙරලා පැමිනෙමින් සිටියේ ය.

1969 ඔක්තෝබර් 12 දා ශ්‍රී ලංකාවේ යාපනයේ දී උපත ලැබූ සෙන්දිල් අයත් වූයේ කලක් ට්‍රොට්ස්කිවාදී පක්ෂයක් වූ ලංකා සමසමාජ පක්ෂය (ලසසප) 1964 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ධනපති ආන්ඩුවට එක් වීමෙන් කල පාවාදීම වෙනුවෙන් දැවැන්ත වන්දියක් ගෙවීමට සිදු වූ පරම්පරාවකට ය. දෙමල විරෝධී වර්ගවාදය සංස්ථාපිත කල ව්‍යවස්ථාවකට ලසසප දැක්වූ සහයෝගය, සමාජවාදී ඉදිරිදර්ශනය පිලිබඳ විශ්වාසයට වල කපමින් ද දෙමල හා සිංහල මහජනතාවන් අතර සුලු ධනේශ්වර ජාතිකවාදී සංවිධානවල වැඩීමට කොන්දේසි සකසමින් ද කම්කරු පන්තියේ දේශපාලන වර්ධනය මත කල් පවත්නා බලපෑමක් ඇති කලේ ය.

මෙම දේශපාලන වාතාවරනය තුල මුහුකුරා ගිය සෙන්දිල් වයස 15 සිට ජාතික අරගලය තුල නිමග්න වීමට පටන් ගති. 1980 ගනන් අග සිංහල හා ඉන්දියානු හමුදාවන්ගේ ඒකාබද්ධ මර්දනයේ ප්‍රතිඵලයක් ලෙස පිටුවාහල් වීමට ඔහුට බල කෙරුනි. මෙය වනාහි දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සහ සෙසු ජාතිකවාදී කන්ඩායම් අතර හටගත් කාන්ඩමික ගැටුම් මගින් තව දුරටත් දරුනු කෙරුනු තත්වයකි.

සෙන්දිල් දෙමල පිටුවාහල් ප්‍රජාවේ තවත් කොටස් සමග එක්ව පලමු වරට හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ආධාරකරුවන් සමග සම්බන්ධතාවන්ට එලඹ ලසසප පාවාදීමේ පමනක් නොව සමාජවාදී ඉදිරිදර්ශනය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාවේ ට්‍රොට්ස්කිවාදීන් කල අරගලයේ ද අර්ථභාරය අවබෝධ කර ගත්තේ 1991 දී ප්‍රන්සයේ දී ය.

ඔහු දෙමල හා ප්‍රන්ස කම්කරුවන් අතර හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ආනුභාවය ගොඩ නැගීමට වෙහෙස නොබලා වැඩ කරමින් කැප වූ ජාත්‍යන්තරවාදියෙක් බවට පත් විය. 2000 දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ දෙමල භාෂා අංශය දියත් කල විට, ඔහු එය වැලඳ ගත්තේ, ඉන්දු උප-මහාද්වීපය තුල හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩ නැගීමේ තීරනාත්මක උපකරනයක් ලෙස ය.

ජනාධිපතිවරන ප්‍රචාරක ව්‍යාපාරයේ ඉහල ම අවස්ථාවේ දී සෙන්දිල් සහෝදරයා පිලිබඳ අනුස්මරන රැස්වීම පැරිසියේ පැවැත්විය යුතු වීම අතිශයින්ම උචිත ය. ඔහු නියෝජනය කලේ, සමාජවාදී පක්ෂයේ සිට තමන් ට්‍රොට්ස්කිවාදී යයි කියාපාන විවිධාකාර කන්ඩායම් දක්වා වූ ප්‍රන්ස වමේ ජාතිකවාදී දර්ශනයට මුලුමනින්ම විරුද්ධ පාර්ශ්වයයි. පීඑස් අපේක්ෂක සෙගොලෙන් රෝයල් පිටුපස පෙල ගැසී සිටින මෙම කන්ඩායම්වල දේශපාලන ක්‍රියාකලාපය ලසසපයෙන් අති මූලිකව වෙනස් නොවේ.

සමාජවාදී සමානතා පක්ෂයේ ජාත්‍යන්තර කතිකයෝ අනුස්මරන රැස්වීම අමතනු ඇත. රැස්වීම ශ්‍රී ලංකාවේ සිද්ධීන්ගේ ඓතිහාසික පාඩම් විශ්ලේෂනය කරමින් ප්‍රන්ස, යුරෝපීය හා ජාත්‍යන්තර කම්කරු පන්තිය සඳහා සමාජවාදී ඉදිරිදර්ශනයක් ඉදිරිපත් කරනු ඇත.

**ලෝක සමාජවාදී වෙබ් අඩවියේ/හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ රැස්වීම**

**රවීන්ද්‍රනාතන් සෙන්දිල් රවි (1969-2007) ට්‍රොට්ස්කිවාදයේ හා සමාජවාදී ජාත්‍යන්තරවාදයේ සටන්කරුවෙක්**

***ඔහු සටන් වැදුනේ කුමන පරමාදර්ශයන් උදෙසා ද: හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ න්‍යාය හා ක්‍රියාමාර්ගය***

**අප්‍රේල් 15 වන ඉරිදා, සවස 3.00**
**එෆ්අයිඑෆ්පී ෂෝන් මොනට්, 30 රූ කැබනිස්, පැරිස්**
***මෙට්‍රො: ග්ලැෂියර්***

***කතිකයෝ:***
**විජේ ඩයස්, ශ්‍රී ලංකාවේ සසප**
**ක්‍රිස් මාර්ස්ඩ්න්, බ්‍රිතාන්‍ය සසප**
**පීටර් ෂ්වාර්ස්, ජර්මානු සසප**

© www.wsws.org